# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2016 සැප්තැම්බර් මස 06 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකා සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රා සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.07.18** වන දින අසන ලද ප්‍රශ්නය.

(ප්‍ර/vi(1)/16/5

අ) බස්නාහිර පලාතේ එක් එක් මැතිවරණ කොට්ඨාශ තුළ වර්ෂ 2009/01/01 දින වන විට සක්‍රීයව පැවති

i) සමූපකාර ප්‍රාදේශික ගණන කීයද? ඒ මොනවාද?
ii) සමූපකාර ග්‍රාමීය බැංකු ගණන කීයද? ඒ මොනවාද?
iii) සුපිරි වෙළඳසැල් ගණන කීයද? ඒ මොනවාද?

ආ) පිළිවෙලින් වර්ෂ 2009 සිට ඉදිරියට මේ දක්වා වාර්ෂිකව අළුතින් ආරම්භ කරන ලද,

i) සමූපකාර ප්‍රාදේශික ගණන කීයද? ඒ මොනවාද?
ii) සමූපකාර ග්‍රාමීය බැංකු ගණන කීයද? ඒ මොනවාද?
iii) සුපිරි වෙළඳසැල් ගණන කීයද? ඒ මොනවාද?

ඇ) පිළිවෙලින් 2009 සිට ඉදිරියට මේ දක්වා වාර්ෂිකව වසා දැමූ;

i) සමූපකාර ප්‍රාදේශික ගණන කීයද? ඒ මොනවාද?
ii) සමූපකාර ග්‍රාමීය බැංකු ගණන කීයද? ඒ මොනවාද?
iii) සුපිරි වෙළඳසැල් ගණන කීයද? ඒ මොනවාද?

ඈ) පිළිවෙලින් වර්ෂ 2009 සිට ඉදිරියට මේ දක්වා පාඩු ලබමින් පවත්වාගෙන යන;

i) සමූපකාර ප්‍රාදේශික ගණන කීයද? ඒ මොනවාද? වාර්ෂික පාඩුව කීයද?
ii) සමූපකාර ග්‍රාමීය බැංකු ගණන කීයද? ඒ මොනවාද? වාර්ෂික පාඩුව කීයද?
iii) සුපිරි වෙළඳසැල් ගණන කීයද? ඒ මොනවාද? වාර්ෂික පාඩුව කීයද?

2. ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය.

( ප්‍ර/vi(1)/16/72 )

**(අ)** (i) වර්ෂ 2009 සිට 2016 ජුනි දක්වා කාලය තුල වසා දැමූ සහ පාඩු ලැබූ සමූපකාර ප්‍රාදේශික/ග්‍රාමීය බැංකු/සුපිරි වෙළඳසැල් ආදිය වසා දැමීමට හේතු වූ කරුණු සොයා බැලීමට යම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද?

(ii) ඒ කුමන ක්‍රියාමාර්ගයක්ද?

(iii) අනාවරණය කරගත් හේතු මොනවාද?

(iv) එම අනාවරණය කරගත් හේතු මත ගෙන ඇති පියවර කුමක්ද?

**(ආ).** ඉහත ප්‍රශ්න අංක අ) (i) හි සඳහන් එකී ආයතනයන් අතුරෙන් සමූපකාර ප්‍රඥප්තියට සහ රීතීන්ට අනුව විමර්ශනය සඳහා පරීක්ෂණ ආරම්භ කර ඇති ආයතන ගණන කීයද? ඒ මොනවාද?

**(ඇ).** (i) මෙම වර්ෂයේ නිරීක්ෂණයන් අනුව වසා දැමීමට යෝජිත, ප්‍රාදේශික/බැංකු/සුපිරි වෙළඳසැල් තිබේද? ඒ මොනවාද?

(ii) එම හඳුනාගත් ආයතන යථා තත්ත්වයට පත් කිරීමට නොහැකි නම් එසේ වීමට හේතු මොනවාද?

(iii) ඒ සඳහා වගකිව යුතු අය සම්බන්ධයෙන් ගෙන ඇති සහ ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග මොනවාද?

(iv) එම හඳුනාගත් පුද්ගලයන්,නම් සහ තනතුරු වශයෙන් කවුරුන්ද?

**(ඈ).** (i) ඉහත වගකිව යුතු නිලධාරීන්/සේවකයන් සම්බන්ධයෙන් රටේ පොදු නීතිය අනුව කටයුතු කර තිබේද? ඒ කවුරුන් සම්බන්ධයෙන්ද?

(ii) එසේ ක්‍රියාකාර නොමැති නම් එයට හේතු මොනවාද?

3. ගරු **එම්.රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින්** ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය.

( ප්‍ර/vi(1)/16/74 )

(අ) බස්නාහිර පළාතේ නිසි පරිදි කසල බැහැර කිරීමේ ක්‍රියාවලිය ප්‍රාදේශීය සභා හා නගර සභා මඟින් තවමත් සාර්ථකව සිදු නොවන බව ඔබතුමා පිළිගන්නේද?

(ආ) කසල වර්ගීකරණය කර බැහැර කිරීම සම්බන්ධව ක්‍රමවේදයක් හඳුන්වාදීම මෙම ගැටළුවට දිය හැකි පිළිතුරක් වන්නේද?

(ඇ) වර්ගීකරණය කරන ලද කසල ප්‍රතිචක්‍රීකරණය කර සම්පතක් වශයෙන් හෝ ආදායමක් බවට පරිවර්තනය කර ගැනීමට ක්‍රමවේදයක් ඔබතුමා හඳුන්වා දෙන්නේද?

(ඇ) ඔබ අමාත්‍යාංශය විසින් මෙතෙක් දුරට කරන ලද කැලිකසල බැහැර කිරීම පිළිබඳ වැඩමුළුවල ප්‍රගතිය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඉ) මහා මාර්ග දෙපස හා ඇල මාර්ග කානු පද්ධති තුල කසල බැහැර කිරීම වැළැක්වීමට ඔබතුමා සකස් කර ඇති වැඩපිළිවෙල කුමක්ද?

(ඊ) කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල කටුනායක-සීදූව නගර සභා සීමාවේ අම්බලම්මුල්ල රජයේ ඉඩමේ එළිමහනේද අපද්‍රව්‍ය බැහැර කරන බව ඔබතුමා දන්නේද?

(උ) එකී අපද්‍රව්‍ය බැහැර කිරීම නිසි පරිදි කළමණාකරණය කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(ඌ) නොඑසේ නම් ඒ මන්ද?

4. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය. **( ප්‍ර/vi(1)/16/76 )**

අ) i. දෙහිවල ගල්කිස්ස මහනගර සභා පාලනය යටතේ පවතින ගල්කිස්ස සුපිරි වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට පියවර ගනිමින් සිටීද?

ii. කවුරුන් විසින් සිදු කරන්නේද?

iii. පවතින ගොඩනැගිල්ල ඉවත් කිරීමෙන් පසු කෙරෙන ව්‍යාපෘතිය කවරේද?

ආ) i. මේ වනවිට වෙළඳසැල් පවත්වාගෙන යන අය වෙනුවෙන් වූ විකල්ප ක්‍රියා මාර්ග කවරේද?

ii. ගොඩනැගිල්ල කැඩීමට පෙර විකල්ප විසඳුමක් දෙන ලෙස ව්‍යාපාරික ඉල්ලීමක් ඇති බව දන්නේද?

iii. එකී ඉල්ලීම නොතකා හරිමින් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව කටයුතු කරන බව දන්නේද?

iv. විෂයභාර ප්‍රධාන අමාත්‍යවරයා ලෙස ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

5. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය.

**( ප්‍ර/vi(1)/16/77 )**

(අ) 2016 වර්ෂයේදී බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව මඟින් "මෛත්‍රී වෙසක් කලාපය" නමින් සම්බුදු තෙමඟුල සිහිකිරීම සඳහා වැඩ සටහනක් පැවැත්වූ බව ඔබතුමා දන්නෙහිද?

(ආ) එසේ නම් ඒ වර්ෂයේදී මෙම වැඩ සටහන සඳහා සභා අරමුදලින් කොපමණ මුදලක් වැය කර තිබේද?

(ඇ) මේ සඳහා පරිත්‍යාගශීලීන් ගෙන් ආධාර වශයෙන් කොපමණ මුදල් ප්‍රමාණයක් එකතු කර තිබේද?

(ඈ) එසේ නම් පරිත්‍යාග ලබා දුන් ආයතන හා පරිත්‍යාග මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් සභා ගත කරන්නේද?

(ඉ) ඒ අන්දමට පසුගිය වර්ෂවලදී ද මෙම වැඩසටහන සඳහා සභා අරමුදල වැයකර තිබේද?

(ඊ) එය කුමන වර්ෂයේදී ද? කොපමණ මුදලක්ද?

6. ගරු ලලිත් එල්ලාවල **මන්ත්‍රීතුමා විසින්** ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය.

( ප්‍ර/vi(1)/16/78 )

(අ) බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව මගින් පාලනයවනු ලබන මෛත්‍රී පෙර පාසල් භූමියේ සිටුවා තිබූ තේක්ක ගසක් ඉවත් කරවා ඇති බව ඔබ දන්නෙහිද?

(ආ) එසේ නම් එම තේක්ක ගස කපා ඉවත් කිරීමට හේතුව කුමක්ද?

(ඇ) එම ගස කපා බිම හෙලුනු ලැබුවේ ප්‍රාදේශීය සභාවේ නීති රාමුව තුලද?

(ඈ) එම ගසින් කපා ගනු ලැබූ දැව කුමන කටයුත්තක් සඳහා යොදා ගනු ලැබුවේද?

7. ගරු ලලිත් එල්ලාවල **මන්ත්‍රීතුමා විසින්** ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය.

( ප්‍ර/vi(1)/16/79 )

(අ) බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අලුත්ගම මැදගම පන්සල පාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2014 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ආ) එසේ නම් එම ගිවිසුම් ප්‍රකාරව එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර තිබේද?

(ඇ) එම ගිවිසුම්ගත පුද්ගලයාට හෝ සමිතියට කොපමණ අත්තිකාරම් මුදල් ප්‍රමාණයක් ගෙවා තිබේද?

(ඈ) එම මුදල ලබාදී තිබෙන්නේ කිනම් වර්ෂයකද? කිනම් දිනයකද?

(ඉ) එම මාර්ගය නිසි පරිදි සංවර්ධනය වී ඇතැයි සෑහීමකට පත් වන්නේද? නැතිනම් ඒ මන්ද?

8. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය.

(ප්‍ර/vi(1)/16/80)

අ)
- i. බප/මීග/ශාන්ත පීතර විද්‍යාලය, බසියාවත්ත, විදුහල්පතිවරිය පත්කරන ලද්දේ කවදා සිටද?
- ii. ඇය විදුහල්පති සේවයේ දරන ශ්‍රේණිය කුමක්ද?
- iii. මෙම පාසල අයත්වන්නේ කුමන වර්ගයකටද?
- iv. මෙම විදුහල්පතිවරියට මෙම පාසැලේ සිටිය හැකිද?

ආ)
- i. මෙම විදුහල්පතිවරිය වැඩභාරගන්නා විට පාසලේ සිටි ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?
- ii. පාසැලේ දැනට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

ඇ)
- i. ආපන ශාලාව ටෙන්ඩර් කිරීමේදී, මුරකරුවන්ට ගෙවීම සඳහා මුදල් එකතු කිරිමේදී, තීන්ත ආලේප කිරීමට මුදල් එකතු කිරීමේදී, සිදුවී ඇති අයථා ගනුදෙනු සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග මොනවාද?
- ii. මීගමුව කලාප කාර්යාලයට යොමුකර ඇති අල්ලස් හෝ දූෂණ කොමිසමට ලැබුණු පැමිණිල්ල පිළිබඳව ගෙන ඇති පියවර කුමක්ද?
- iii. ඒ පිළිබඳව ඔබ දැනුවත් කර තිබේද?

ඈ)
- i. මෙම විදුහල්පතිවරිය පාසල් සිසුන්ට අසත්‍ය චෝදනා නගමින් මානසිකව පීඩාවට පත්කරන බව ඔබ දන්නෙහිද?
- ii. මේ පිළිබඳව හා මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව විමර්ශනයන් සිදුකර තිබේද?
- iii. එහි ප්‍රතිඵල කවරේද?
- iv. නැතිනම් විමර්ශනයන් කිරීමට පියවර ගන්නේද?
- V එය ආරම්භ කරන්නේ කවදාද?

9. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2016.08.23** වන දින අසන ලද ප්‍රශ්නය.

(ප්‍ර/vi(1)/16/81)

අ)
- i. මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කඩවත, ඇල්දෙනිය අධිවේගී මාර්ගයට පිවිසෙන බණ්ඩාරනායක මාවත අසල කුඹුරු ඉඩම් අක්කර ගණනාවක් ගොඩකර ඇති බව ඔබ දන්නෙහිද?
- ii. මෙම ඉඩම් මහර ප්‍රාදේශීය සභාවට පවරාගෙන තිබේද?
- iii. එසේ නම් ඒ කෙසේද? කවරකුගෙන්ද?
- iv. ඒ සඳහා ගෙවා ඇති වන්දිය කොපමණද?

(ආ) i. මෙම ගොඩකර ඇති කුඹුරුවල නියරට මායිම්ව අඩි 12 ක් පළල මාර්ගයක් තිබූ බව ඔබ දන්නේද?

ii. එය අඩි 8 දක්වා පළල අඩු කිරීමට අදාළ බලධාරීන් කටයුතු කරමින් තිබෙන බව ඔබ දන්නේද?

iii. එම මාර්ගය වෙනුවට අඩි 15 ක් පළල මාර්ගයක් ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද?

(ඇ) i. කුඹුරු ඉඩම් ගොවියන් මුලාකර පෞද්ගලිකව ජී.ජී. ජයන්ත කුමාර ප්‍රේමලාල් යන අයගේ නමට පවරාගෙන ඇති බව ඔබ දන්නේද?

ii. ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කරන්නේද?

10. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට :

(ප්‍ර/vi(1)/16/82)

(අ) බස්නාහිර පළාත් සභාව තුළ මේ වන විට සේවයේ නියුතුව සිටින ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයට අයත් නිළධාරීන් සංඛ්‍යාව කොපමණද?

(ආ) එම නිළධාරීන් දැනට සේවයේ නියුතුව සිටින ස්ථාන මොනවාද?

(ඇ) බස්නාහිර පළාත් සභාව තුළ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද?

(ඈ) ඒ අනුව ගණකාධිකාරි සේවයේ ඇබෑර්තු කොපමණ සංඛ්‍යාවක් බස්නාහිර පළාත් සභාව තුළ පවතීද?

(ඉ) එම ඇබෑර්තු පවතින්නේ කොපමණ කලක සිට දැයි සඳහන් කළ හැකිද? නොඑසේ නම් ඒ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01 . ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා :**

"අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නව රජය මගින් පසුගිය රජය විසින් කරන ලදැයි කියන දූෂණ, වංචා, මිනීමැරුම්, රාජ්‍ය දේපල අයුතු ලෙස පරිහරණය කිරීම, පිළිබඳව මේ වන විටත්, ඒ සඳහා කමිටු පත් කරමින් වැරදි කරුවන්ට නීතිය මගින් දඬුවම් කිරීම සතුටට කරුණකි.

1989 හා 1990 කාල වකවානුව තුළ තරම් මෙරටේ අති විශාල වශයෙන් රාජ්‍ය දේපල විනාශ කරමින් මිනිස් ඝාතන සිදු වූ කාල පරිච්ඡේදයක් මෑත ලංකා ඉතිහාසයේ නොමැත. එබැවින් මේ පිළිබඳව සොයාබැලීමට කමිටුවක් පත් කර එම රාජ්‍ය දේපල විනාශ කර මිනිස් ඝාතන සිදු කළ පුද්ගලයන්ට නීතිය මගින් දඬුවම් කිරීම හා විනාශ කළ රාජ්‍ය දේපලවල වටිනාකම අදාල වැරදිකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා මෙන් අතිගරු ජනාධිපතිතුමාගෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව ඉල්ලා සිටියි."

(යෝ/ VI(I)/15/02)

(2016.08.09 හා 23 යන දිනවල පැවැති සභා රැස්වීම්හි වැඩ කටයුතු හා සම්බන්ධිතයි.)

**02. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා;**

"පාසැල්වලට ළමුන් ඇතුළත් කර ගැනීම දැඩි අර්බුදකාරී තත්වයකට පත්ව ඇත.

පළමුවන ශ්‍රේණියට සහ හය වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා අනෙකුත් ශ්‍රේණි වලට ළමුන් ඇතුළත් කර ගන්නා ක්‍රමවේදයට සාපේක්ෂව වඩා විධිමත්වූ වැඩ පිළිවෙළක් සකස් වී තිබුණද, එම අනෙකුත් ශ්‍රේණි සඳහා ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා එවන් විධිමත් වැඩපිළිවෙලක් නොමැත. ඒ නිසාම ළමුන් ඇතුළත් කර ගැනීමේදී විවිධ අල්ලස් ගැනීම්, දූෂණ, විවිධ අක්‍රමිකතා සිදු වෙමින් පවතින බව දැනගන්නට ඇත.

එහෙයින්, පළමුවන ශ්‍රේණියට සහ හය වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදීදැනට ක්‍රියාත්මක වන්නාක් මෙන්ම අනෙකුත් ශ්‍රේණි වලටද ළමුන් ඇතුළත් කිරීම සඳහා වඩා විධිමත් වූ ක්‍රමවේදයන් සකස් කර බස්නාහිර පළාතේ පාසැල් වලට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් අදාල සියළු පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි.

(යෝ/vi(1)/15/04)

## X. - සභාව කල් තැබීම

එන්.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.08.24 දින

සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය.
බත්තරමුල්ල.